පිටපත් හිමිකම් ඇවිරිණි / All Right Recerved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Southern Provincial Department of Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 13 ශ්‍රේණිය.
පළමු වාර පරීක්ෂණය - 2018 - නොවැම්බර්
கல்விப் பொதுத் தராதர (உயர்தரப்) பரீட்சை 2018 நிலை, தரம் 13 முதலாம் தவணைப் பரீட்சை
General Certificate of Education (Adv. Level) Grade 13 First Term Test 2018 November

බෞද්ධ ශිෂ්ටාචාරය
පිළිතුරු පත්‍රය
Buddhist Civilization - Answer

45 | S | I - II

## I - කොටස

| | | | | |
|---|---|---|---|---|
| 1 - 2 | 11 - 1 | 21 - 5 | 31 - 2 | 41 - 3 |
| 2 - 3 | 12 - 2 | 22 - 2 | 32 - 1 | 42 - 2 |
| 3 - 5 | 13 - 4 | 23 - 3 | 33 - 4 | 43 - 1 |
| 4 - 4 | 14 - 3 | 24 - 1 | 34 - 3 | 44 - 2 |
| 5 - 1 | 15 - 2 | 25 - 3 | 35 - 2 | 45 - 3 |
| 6 - 1 | 16 - 3 | 26 - 2 | 36 - 5 | 46 - 4 |
| 7 - 2 | 17 - 5 | 27 - 4 | 37 - 1 | 47 - 5 |
| 8 - 4 | 18 - 4 | 28 - 1 | 38 - 2 | 48 - 2 |
| 9 - 3 | 19 - 3 | 29 - 2 | 39 - 3 | 49 - 1 |
| 10 - 4 | 20 - 1 | 30 - 4 | 40 - 5 | 50 - 5 |

(ලකුණු 2 × 50 = 100)

## II - කොටස

(1) (i) පශුපාලනය, දන්දීම, යාග කිරීම, වේද අධ්‍යයනය, වෙළදාම, මුදල් පොලී කිරීම, කෘෂිකර්මාන්තය
ප්‍රජානං රක්ෂණං දාන - මිජ්‍යාධ්‍යයන මේවච -
විෂයේෂ්ව ප්‍රසක්තිශ්ච - ක්‍ෂත්‍රියස්‍ය සමාසතඃ
(මනු: 1-89 ශ්ලෝකය පමණක් ලියා ඇත්නම් ලකුණු 02කි. නම් කිරීම පමණක් නම් ලකුණු 4කි.)

(ii) හදිසි විපත්ති ලෙස බලපාන පොදු ආපදාපන්න තත්ත්වයන් හෝ ඒ ඒ වර්ණවල සාමාජිකයන්ට තම වර්ණයට නියමිත කාර්යයන් ඉටු කිරීමට නොහැකි වූ කිසියම් ශාරීරික පීඩාවක් ඇති වූ අවස්ථා ආපදාපන්න අවස්ථා ලෙස හැඳින්වේ. එවැනි අවස්ථාවල දී අනුගමනය කිරීම සඳහා නිර්දේශිත ධර්මය 'ආපද්ධර්ම' නමින් හඳුන්වයි.
* බ්‍රාහ්මණයාට තමාට වඩා පහත් ශ්‍රේණි වූ ක්‍ෂත්‍රිය හා වෛශ්‍යයන්ට නියමිත කාර්යවල නිරත විය හැකි ය.
* ක්‍ෂත්‍රියයාට තමන්ට වඩා පහත් ශ්‍රේණි වූ වෛශ්‍යයන්ට හිමි කටයුතුවල නිරත විය හැකි ය.
* වෛශ්‍යයාට තමාට පහළින් වූ ශුද්‍රයන් විසින් කරනු ලබන කටයුතුවලට නිරත විය හැකි ය.
* ශුද්‍රයාට විශේෂිත කාර්යයන් නොවූයේ මෙහි අවරෝහන පරිපාටිය ක්‍රියාත්මක වූ බැවිනි.

(iii) ත්‍රිවේද පාරප්‍රාප්ත බ්‍රාහ්මණ පූජකයන්ගේ සහභාගිත්වය
* ශුභ නැකතින් යාග ස්ථම්භය (කප) සිටුවා වේද ගීතිකා ගායනය ආරම්භ කිරීම.
* වේද ගීතිකා ගායනය ආරම්භයේ පටන් යාගය නිමවන තුරු ගිනි පූජාව පවත්වා ගැනීම.
* පූජාසනය මත කැවිලි, පලතුරු, මල් පහන්, සුවඳ (පූජා ද්‍රව්‍ය) තබා පූජා පැවැත්වීම.
* ඒ ඒ යාගයට ගැලපෙන පරිදි බිලි පූජා පැවැත්වීම.

(iv) පූරණ කස්සපගේ ඉගැන්වීම අකිරියවාදී ය. දී.නි. සාමඤ්ඤඵල සූත්‍රයේ සඳහන් වේ.
* අකිරියවාදය නම් පුද්ගලයකු විසින් කරනු ලබන කිසිදු හොඳ හෝ නරක ක්‍රියාවක් නැති බවත් ඒවායෙන් විපාක නැති බවත් පිළිබඳ ඉගැන්වීමයි.
* "කරෝතෝ ඛෝ මහා රාජ කාරයතෝ ඡින්දතෝ ඡේදාපයතෝ....." යනාදී ලෙස කුසලාකුසල කර්ම ඵලය ප්‍රතික්ෂේප කරන නිසා මෙතුමාගේ දර්ශනය අකිරිය වාදයකි.
* සමස්ත පෘථිවියේ සියලු ප්‍රාණීන් මරා එක ම මස් ගොඩක් කළ ද ඒ හේතුවෙන් උපදනා පාපයක් නැත.
* දන් දෙමින්, දන් දෙවමින්, යදිමින්, යදවමින්, ගංගාතීරයේ උතුරු කෙළවර තෙක් ගියේ වී නමුදු එයින් පිනක් නැත. පිනෙහි පැමිණීමක් ද නැත. (නත්ථි පුඤ්ඤං නත්ථි පුඤ්ඤස්ස ආගමෝ) යනාදී කරුණු මොහුගේ ඉගැන්වීම ලෙස හඳුනාගත හැකි ය.

(v) * නකුල පියා නම් ගුණවත් උපාසකතුමාගේ බිරිඳ නකුල මාතා ය.

* යොවුන් වියේ සිට ආදර්ශසම්පන්න විවාහ දිවියක් ගෙවූ අතර දෙදෙනා ම බුදුරදුන්ගේ ඇගයීමට ලක් විය.
* සිතිනුත් කයිනුත් පතිවත රැකි කාන්තාවකි.
* ශ්‍රද්ධා සීල, ත්‍යාග, ප්‍රඥා යන ගුණ ධර්ම ආරක්ෂා කළේ ය.
* නකුල මාතාවගේ සත්‍යක්‍රියා මත නකුල පියාගේ රෝග සුව විය.
* නකුල පියා සමග සමගියෙන්, ආදර්ශ සම්පන්නව ඔහුට අවවාද දෙමින් යහපත් දිවියක් ගත කළේ ය.
* තෙරුවන් කෙරෙහි අප්‍රමාණ ගෞරවයකින් යුක්ත විය.
* විශ්වාසවන්ත උපාසිකාවන් අතර අග්‍ර විය.

(ලකුණු 4 × 5 = 20)

(2)(i) දානය, සීලය, පරිත්‍යාගය, ඍජුබව, මෘදු බව, තපස, අක්‍රෝධය, අවිහිංසාව, ඉවසීම, අවිරෝධතාවය (විරුද්ධ නැති බව)

(ii) * උතුරෙන් ගංගා නදිය ද, නැගෙනහිරින් චම්පා නදිය ද, නිරිත දෙසින් වින්ද්‍යා කඳු වැටිය ද, බටහිරින් සෝණ නදිය ද මගධදේශයේ සීමා විය.

* අගනගරය රජගහනුවර විය. බිම්බිසාර හා අජාසත්ත රජු බුද්ධ කාලීන පාලකයෝ විය.
* වේභාර, වේපුල්ල, ගිජ්ඣකූට, ඉසිගිලි පාණ්ඩව යන පර්වත පහකින් යුක්ත වූ නිසා 'ගිරිබ්බජ' නමින් ද හැඳින්වී ය.
* පිතෘඝාතක රාජ පරම්පරාවක් ඇති විය.
* ප්‍රථම ආරාම පූජාව වූ වේළුවනාරාමය බිම්බිසාර රජතුමා විසින් පූජා කළේ ය.
* රාජාණ්ඩු පාලන ක්‍රමයක් පැවතියේ ය.
* බලය පුළුල් කර ගැනීමට මත්ස්‍ය න්‍යාය ක්‍රියාත්මක කළේ ය. ආදී කරුණුවලින් හා අදාල කරුණු පහක්වත් තිබේ නම් මුළු ලකුණු ලබා දෙන්න.

(iii) දෙමාපියන්ගෙන් දරුවන්ට,

* යහපතෙහි යෙදවීම. (කල්‍යාණේ නිවේසෙන්ති)
* දරුවන් වරදින් වලක්වා ගැනීම. (පාපා නිවාරෙන්ති)
* අධ්‍යාපනය ලබා දීම. (සිප්පං සික්ඛාපෙන්ති)
* සුදුසු කල ආවාහ විවාහ කර දීම. (පතිරූපෙන දාරෙන සංයෝජෙන්ති)
* සුදුසු කල්හි දායාද පවරා දීම. ( සමයෙ දායජ්ජං නිය්‍යාදෙන්ති)

දරුවන්ගෙන් දෙමාපියන්ට,

* මව්පියන් පෝෂණය කිරීම. (භතො නෙ භරිස්සාමි)
* ඔවුන්ගේ කටයුතු ඉටුකර දීම. (කිච්චං නෙසං කරිස්සාමි)
* කුලපරම්පරාව රැක ගැනීම. (කුලවංසං ඨපෙස්සාමි)
* දායාද රැක ගැනීම. (දායජ්ජං පටිපජ්ජාමි)
* මියගිය පසු පින් අනුමෝදන් කිරීම. (අථ වා පන පේතානං - කාල කතානං දක්ඛිණං අනුප්පදස්සාමි)

(iv) * බ්‍රහ්මාති මාතා පිතරෝ......

* මාතා පිතු උපට්ඨානං.....
* මාතා පිතා දිසා පුබ්බා.....
* මාතා මිත්තං සකේ ඝරේ.....
* මවට නොසලකන පුද්ගලයා වසලයෙකු බව වසල සූත්‍රයේ ද, මවට නොසලකන්නා පිරිහෙන බව පරාභව සූත්‍රයේ ද දක්වා ඇත.
* මව ඝාතනය කිරීම ආනන්තරිය පාප කර්මයකි.
* බුදුරදුන් මාතෘ දිව්‍ය රාජයාට දහම් දෙසීමට දෙව්ලොවට වැඩම කිරීම.
* මහා ප්‍රජාපතී ගෝතමී දේවියට මවක් ලෙස ගෞරව කිරීම... ආදී කරුණු හතරක් පදනම් කරගෙන පිළිතුරු අපේක්ෂා කෙරේ.

(v) * ඡන්දය, ද්වේෂය, භය, මෝහය යනු සතර අගතියි.

* ඡන්දය යනු කැමැත්තයි. එය අගතියක් වනුයේ ඒ තුළින් නොමග ගොස් මධ්‍යස්ථ නොවී තම කැමැත්තට අනුව කටයුතු කිරීමයි.
* ඡන්දයෙන් අගතිගාමී වූ විට තමන් කැමති අයට වාසි වන පරිදි තීරණය ගැනීමටත්, ඔවුන්ට වරප්‍රසාද දීමටත් යොමු වේ.
* ද්වේෂය යනු තරහවයි. ද්වේෂයෙන් දූෂිත වූ මනෝභාවය තුළින් සමාජ අසාධාරණකම් සිදු කරයි.
* භය යනු බියගුලු බව යි. ස්වාධීනත්වයට බාධා පමුණුවන මෙය වැරදි තීරණ ගැනීමට හේතු වෙයි. මේ නිසා පුද්ගලයාට සුදුසු තනතුරු නොලැබී යා හැකි ය.
* මෝහය යනු අනුවණකමයි. මුළාවෙන් අගතිගාමී වීම නිසා වැරදි ක්‍රියාවලට යොමු වෙයි.
* සත්‍යය හා යථාර්ථය යටපත් කර වැරදි තීන්දු ගැනීමට මෙය හේතු වෙයි.

(ලකුණු 4 × 5 = 20)

(3) (i) (i) ප්‍රාණඝාතය (පරපණ නැසීම.)
(ii) අදත්තාදානය (සොරකම් කිරීම.)
(iii) කාම මිථ්‍යාචාරය (කාමයෙහි වරදවා හැසිරීම.)
(iv) මුසාවාදය (බොරු කීම.)
(v) ඵරුසාවාචා (රළු වචන කීම, පරුෂ වචන කීම.)
(vi) පිසුනාවාචා (කේළාම් කීම.)
(vii) සම්ඵප්පලාප (හිස් වචන කීම.)
(viii) අභිජ්ඣාව (දැඩි ලෝභය.)
(ix) ව්‍යාපාදය (ද්වේෂය.)
(x) මිථ්‍යා දෘෂ්ටිය (වැරදි දෘෂ්ටිය.)

(ii) තමා උපමා කරගෙන ක්‍රියා කිරීමයි.
සබ්බේ තසන්ති දණ්ඩස්ස - සබ්බේ භායන්ති මච්චුනෝ
අත්තානං උපමං කත්වා - න හනෙය්‍ය න ඝාතයේ
තමා මෙන් ම සියලු සත්වයෝ ම දඬුවමට, මරණයට බිය වෙයි. එහෙයින් තමා උපමා කොට අනුන්ට පීඩා කිරීම නොකළ යුතු ය.සෑම සත්වයකු ම සැප විඳීමට කැමතිය. දුක් විඳීම අප්‍රිය කරයිත ජීවත් වීමට කැමතිය. මරණයට අකමැති ය. මෙම තත්වය තමා පිළිබඳව මෙන් ම සියලු සත්වයන් පිළිබඳවද යථාර්ථය යි. සත්ව ඝාතනය, සොරකම ආදී සදාචාරාත්මක නොවන ක්‍රියාවන්ගෙන් වැළකීම සඳහා තමා උපමා කර ගැනීම අත්තූපනායික ධර්ම පර්යාය නමින් හැඳින්වේ.

(iii) * සත්ත්වයා හා ලෝකය පිළිබඳ ඊශ්වර නිර්මාණවාදය බැහැර කිරීම.
* වේදය පරම සත්‍ය ලෙස පිළිගත් බ්‍රාහ්මණ ඉගැන්වීම් බැහැර කිරීම.
* ඥානමාර්ගය ගරු කිරීම.
* යාගය ප්‍රතික්ෂේප කිරීම.
* බ්‍රහ්ම චර්යාව හා අනගාරික ප්‍රතිපදාව පිළිගැනීම.
* කාන්තාවට ආගමික නිදහස ලබා දීම.
* උපත පදනම් කරගත් සමාජ වර්ගීකරණයන් බැහැර කිරීම.
* අල්පේච්ඡතාව, සුභරතාව වැනි ගුණ ධර්ම අගය කිරීම.
* නව විමුක්ති මාර්ගයන් සොයා යාම.

(iv)* මගධ රාජ්‍යයේ පාලකයා වූ බිම්බිසාර රජතුමා සිදුහත් බෝසතාණෝ ගිහි ගෙයින් නික්ම යන අවස්ථාවේ මගධයේ කොටසක් ගෙන පාලනය කරන්නැ යි ඉල්ලා සිටීම.
* ප්‍රථම ආරාම පූජාව ලෙස වේළුවනාරාමය කනවා බුදුරදුන්ට පූජා කිරීම.
* අජාසත් රජු බුදුරදුන් හමුවීමට ගොස් දැන හඳුනාගෙන දැඩි සබඳතා පැවැත්වීම.
* සාමඤ්ඤඵල සූත්‍රය අසා අජාසත් රජු බෞද්ධයකු විය.
* කෝසල සංයුක්තයේ එන සූත්‍ර විසිපහම කොසොල් රජු වෙත දේශනා කර ඇත.
* සුද්ධෝදන රජුගේ ඉල්ලීම මත විනය නීති පැනවීම. කිඹුල්වත් නුවර නිග්‍රෝධාරාමය පූජා කිරීම හා ඥාතීන් අතර සමීප සබඳතා පැවැත්වීම.
* චණ්ඩපජ්ජෝත රජතුමා, උදේනි රජතුමා, මල්ල රජවරු වජ්ජී රටේ ලිච්ඡවීන් සමඟ සමීප සබඳතා පැවැත්වීම.

(v)* ධර්මය අප්‍රිය කිරීම.
* අසාධූන් ප්‍රිය කිරීම.
* අසත් පුරුෂයන් ප්‍රියවීම.
* සත්පුරුෂයන් අප්‍රිය කිරීම.
* නින්දට ප්‍රිය වීම.
* දොඩමලු බව.
* වීර්යයෙන් තොර වීම.
* අලස බව.
* ක්‍රෝධය.
* මහලු වියට පත් මව්පියන්ට නොසැලකීම.
* බොරුවෙන් මහණ බමුණන් රැවටීම.
* සැප සම්පත් තනි ව භුක්ති විඳීම.
* ජාතිය, ධනය, ගෝත්‍රය, යන මේවායින් උඩඟුව නෑයන් පහත් කොට සැලකීම.
* ස්ත්‍රීන් කෙරෙහි ලොල් බව.
* සුරාවෙහි ලොල් බව.
* දූ කෙළියෙහි ලොල් බව.
* වෙසඟනන් පසා යාම.
* පරඹුවන් පසා යාම.
* මහලුව තරුණියන් සරණපාවා ගැනීම.
* ආහාර පානයෙහි ගිජු අරපරෙස්සම නැති ස්ත්‍රියක හෝ පුරුෂයකු හෝ ප්‍රධානත්වයෙහි තැබීම.
* ක්ෂත්‍රිය කුලයෙහි උපත ලබා ඇතත් රාජ්‍යයට නුසුදුසු දුප්පත් තෘෂ්ණාධික අයෙකු රජකම පැතීම.
යන කරුණුවලින් අටක් පිළිතුරු ලෙස ලියා ඇත්නම් ප්‍රමාණවත් ය.

(ලකුණු 4 × 5 - 20)

(4)(i)* සෘග් වේදයේ 10වන මණ්ඩලයේ සඳහන් වන්නේ මහා බ්‍රහ්මයා තම සිරුරේ ස්ථාන හතරකින් බ්‍රාහ්මණ, ක්ෂත්‍රිය, වෛශ්‍ය, ශුද්‍ර යන කුල හතර නිර්මාණය කළ බව යි. (බ්‍රාහ්මණෝස්‍ය මුඛ මාසීද්...)
* බ්‍රාහ්මණ, ක්ෂත්‍රිය, වෛශ්‍ය, ශුද්‍ර යන සිව් කුලයට නියම කර තිබූ ස්වධර්ම වෙන් වෙන් ලෙස මනුස් මෘතියේ සඳහන් වේ. ඒ අනුව රැකියා තීරණය විය.
* වර්ණ භේද ප්‍රතිපත්තිය ශක්තිමත් කිරීමට ආගම ධර්ම යොදා ගන්නේ ය.
* ආර්ය කුල සාමාජිකයන් නියමිත වයස්සීමාවලදී අධ්‍යාපනය ලැබුව ද, ශුද්‍රයාට අධ්‍යාපන අයිතිය, කැමති රැකියාවක් කිරීමේ අයිතිය, කැමති තැනක ජීවත් වීමේ අයිතිය, ඉඩකඩම් අයිතිය මෙන් ම නීතිය ඉදිරියේ සමානාත්මතාවය ද අහිමි විය.
* ආගමික කටයුතු පිළිබඳ අයිතිය ද ශුද්‍රයාට අහිමි විය.
* වෛශ්‍යයන් කොතරම් ධනවත් වුව ද සමාජයේ තෙවන ස්ථානය ඔවුන්ට හිමි විය.
* බ්‍රාහ්මණයන් සමාජ සැලැස්ම සකස් කළේ තමන්ගේ ලාභ ප්‍රයෝජන සඳහාම ය.

(ii) වර්ණ භේදයේ සම්භවය පිළිබඳ බෞද්ධ මතය දීඝනිකායේ අග්ගඤ්ඤ සූත්‍රයේ සඳහන් වේ.
* ක්ෂෙත්‍රවලට අයිති වූ බැවින් "ඛෙත්තානං ආධිපතීති ඛත්තියෝ" ක්ෂත්‍රිය නමින් ද,
* පාප කර්ම බැහැර කිරීමට උත්සුක වූ බැවින් "බාහිත පාප ධම්මෝ බ්‍රාහ්මණෝ" පව් බැහැර කරන අදහසින් 'බ්‍රාහ්මණ' නමින් ද,
* "විස්සුං විස්සුං කම්මන්තේ පයෝජෙන්තීති වෙස්සා" විවිධ වූ කර්මාන්ත, එනම් ධනෝපායන මාර්ග වූ ගොවිතැන වෙළදාම, සත්ත්ව පාලනය, මුදල් පොළී කිරීම වැනි කාර්යයන්හි නිරත වූ පිරිස 'වෛශ්‍ය' නමින් ද,
* "ලුද්ද ලුද්ද සමාචාරා සුද්දා" රළු පැවතුම්, පහත් කර්මාන්ත එනම් දඩයම, සොරමැරකම්, වංචා ආදී දුසිරිතෙහි නිරත වූ පිරිස් ශුද්‍ර යන පහත් නාමයෙන් හැඳින්වී ය. චතුර්වර්ණයේ ප්‍රභවය පිළිබඳ ඉහත කරුණු ඇතුළත් බෞද්ධ මතය අනුව පිළිතුරු සකස් විය යුතු ය.

(ලකුණු 10 × 2 - 20)

(5)(i) බුදුරජාණන් වහන්සේ ධර්මදේශනා සඳහා විවිධ සන්නිවේදන ක්‍රම භාවිතා කළ බව.
* සෘජු දේශනා ක්‍රමය (දම්සක් පැවතුම් සූත්‍රය) සාකච්ඡා ක්‍රමය, (කන්දරක සූත්‍රය) උපමානුසාරී දේශනා ක්‍රමය (රාහුලෝවාද සූත්‍රය - කළිඟාරද්වාර සූත්‍රය) පැවරුම් ක්‍රමය (චුල්ලපන්ථක තෙරුන්ට, කිසාගෝතමියට මග පෙන්වීම.)
* අත්තජ්ඣාසය පරජ්ඣාසය අට්ඨුප්පත්තික, පුච්ඡාවසික යන ධර්ම දේශනා ක්‍රම පුරුදුගෙන ව යොදාගත් බව.
* ප්‍රශ්න විසඳීම සඳහා ඒකංස ව්‍යාකරණීය, විභජ්ජ ව්‍යාකරණීය, පටිපුච්ඡා ව්‍යාකරණීය, ඨපනීය යන ක්‍රම භාවිත කළ බව. මෙම කරුණු ඇතුළත් කරමින් නිදසුන් දක්වමින් පිළිතුර සකස් විය යුතු ය.

(ii) ශාස්තෘවරයකු වශයෙන් බුදුරදුන් තුළ පැවති අසම සම පෞරුෂය හා සන්නිවේදන හැකියාව.
* විචිත්‍ර දේශනා ක්‍රම යොදා ගැනීම.
* කුල භේදය නොසලකා සියලු දෙනාට පිහිටවීම.
* බුදුරජාණන් වහන්සේ රජ පෙළපතින් පැවතෙන දෙතිස් මහා පුරුෂ ලක්ෂණයන්ගෙන් සමන්විත වීම.

* බුදු දහම මුල, මැද, අග ස්වාක්ඛාත, අකාලික, ඒහි පස්සික ආදි ගුණාංගයන්ගෙන් සමන්විත දහමක් වීම.
* ප්‍රථම ධර්මදූත කණ්ඩායමේ පටන් ශ්‍රාවක රහතන් වහන්සේලා ගම් නියම් ගම් සැරිසරා ධර්මය ප්‍රචාරය කිරීම.
* රජවරු, සිටුවරු මෙන් ම කාන්තා සමාජය ද බුදු දහම ව්‍යාප්ත කිරීමට සෘජුව දායක වීම.
* පීඩනයට පත් වූ ජනතාවට මානසික සුවය බුදු දහමින් ලැබීම ආදී කරුණු ඇතුළත් කරමින් පිළිතුර සකස් විය යුතු ය.

(ලකුණු 10 x 2 = 20)

(6) (i) ස්වාමිත්වය යනු :-තමාට තමා හැර වෙනත් ස්වාමියකු හෝ තමා පාලනය කරන බලඅධිකාරයක් නොමැති බව.

* ස්වාධීනත්වය යනු නිදහසේ තම කැමැත්ත පරිදි ක්‍රියා කිරීමේ හැකියාව.
* ස්වච්ඡන්දතාවය යනු සිය කැමැත්ත අනුව හොඳ නරක තමා විසින්ම තීරණය කිරීම.
* ඊශ්වර නිර්මාණවාදී ඉගැන්වීම් අනුව සත්ත්වයා හා ලෝකය සර්ව බලධාරී ඊශ්වරයකු විසින් පාලනය කරන බව දක්වයි. වර්ණ ධර්ම, ස්වධර්ම, ආශ්‍රම ධර්ම, තුළින් පුද්ගල ස්වාමිත්වයට, ස්වාධීනත්වයට, ස්වච්ඡන්දතාවයට බාධා පැමිණ විය.
* පුබ්බෙකතහේතුවාදය, අහේතු අප්පච්චය වාදය නියතිවාදය වැනි ඉගැන්වීම් තුළින් මිනිසාගේ ස්වාධීනත්වයට බාධා පැමිණ වූ බව. යනා දී කරුණු ඇතුළත් කරමින් පිළිතුරු සකස් විය යුතු ය.

(ii) පුද්ගලයාගේ ස්වාධීනත්වයට, ස්වාමිත්වයට ස්වච්ඡන්දතාවයට බාධා පමුණුවන ඉගැන්වීම් බුදු දහමින් ප්‍රතික්ෂේප විය.

* සිතා මතා ස්වාධීනව, හොඳ නරක තේරුම් ගෙන තීරණ ගැනීමට නිදහස ඇති බව ද සංචේතනික ක්‍රියා හා බැඳුණු වග කීම සත්ත්‍වයා වෙත පැවරෙන බව ද මොනවට වැටහේ යි.
* තමාගේ ජයග්‍රහණ මෙන් ම විමුක්තිය ද තමා විසින්ම සලසා ගත යුතු ය.
* අත්තාහි අත්තනො නාථෝ - කෝහි නාථෝ පරෝසියා...
* අත්ත දීපා විහරථ - අත්ත සරණා අනඤ්ඤසරණා...
* සුද්ධි අසුද්ධි පච්චත්තං - නාඤ්ඤමඤ්ඤෝ විසෝධයේ...
* උට්ඨාන වීරිය, අප්පමාද, පුරිසථාම, පුරිසබල, පුරිස වීරිය, පුරිසපරක්කම, ආරම්භධාතු, නික්කමධාතු, පරක්කම ධාතු, සම්මාවායාම වැනි ධනාත්මක ඉගැන්වීම් තුළින් පුද්ගල පෞරුෂය ගොඩ නැගීමට මග පෙන්වා ඇත.
* කාලාම සූත්‍රය හා වීමංසක සූත්‍රයේ කරුණු ද ඇතුළත් කළ හැකි ය.

(ලකුණු 10 x 2 = 20)

7. (i) න භජේ පාපකේ මිත්තේ<br>
න භජේ පුරිසාධමේ<br>
භජේථ මිත්තේ කල්‍යාණේ<br>
භජේථ පුරිසුත්තමේ

පාප මිත්‍රයන් ආශ්‍රය නොකළ යුතු ය. අධම පුරුෂයන් හෙවත් පහත් ගැලුණු මිතුරන් ආශ්‍රය නො කළ යුතු ය. කළණ මිතුරන් ඇසුරු කළ යුතු ය. උත්තම පුරුෂයන්, (උතුම් සත්පුරුෂයන්) ඇසුරු කළ යුතු ය.

(ii) ධම්මපදයේ නිර්දේශිත ගාථාවලින් තුනක් ඇසුරු කරගෙන සාමය, සමගිය, සහජීවනය සඳහා ඒවායේ අදහස් ගලපා සකස් කළ පිළිතුරක් අපේක්ෂා කෙරේ.

(ලකුණු 10 x 2 = 20)

8. (i) * ජෛව ගෝලය, වායු ගෝලය, ජල ගෝලය සහ පාංශු ගෝලය පරිසරය ලෙස හැඳින්වේ.මෙම පද්ධතිවල ගැටලු මතු වී ඇත.

* ප්‍රමාණවත් පිරිසිදු ජලය නොමැතිකම ද විවිධ ගැටලු සඳහා හේතු වෙයි.
* පරිසර සංරක්ෂණය සඳහා පුද්ගලයා යොමු කිරීමට බුදුරදුන් ක්‍රියා කළ හ.
* රමණීයානි අරඤ්ඤානි...
* ථේරගාථා නදී තීරය වර්ණනා කිරීම.
* ජලයට මුත්‍රා කිරීම, කෙළ ගැසීම, මලපහ කිරීම තහනම් කිරීම - පාචිත්තිය පාලිය.
* ගස් කැපීම, බීජ විනාශ කිරීම, කොළ කැඩීම ආදිය උපසම්පදා භික්ෂූන්ට තහනම් කිරීම. - පාචිත්තිය පාලිය.
* මිනිස් ජීවිත මෙන් ම සියලු සත්ත්ව ජීවිතවල ජීවත් වීමේ අයිතිය තහවුරු කිරීම පංච සීලයෙන් ද මෛත්‍රී භාවනාවෙන් ද සිදු කර ඇත.
* නොකළ යුතු වෙළඳාම් කිරීම සෘජු ව මෙන් ම වක්‍රව පරිසර සංරක්ෂණයට බාධා වන බව.
* පරිසර සංරක්ෂණය පිණිවැවෙන කුසල් ලෙස දක්වීම. (ආරාම රෝපා වන රෝපා.... - වනරෝප සූත්‍රය)
* බුදුරදුන් ද පරිසරයේ වැඩ සිටීම. (රුක් සෙනසුන් හා වන ලැහැබ ප්‍රිය කිරීම.)
* බුදු පිරිසත් අවසන් මොහොත ද පරිසරය හා සම්බන්ධ පැවැත්වීම, වැනි කරුණු ආදර්ශ වේ.
* වර්තමානයේ පාරිසරික ගැටලු අතර ජල දූෂණය, වායු දූෂණය, වන විනාශය, කැලි කසල හොඳ ගැසීම ආදිය නිසා ජීවන දුෂ්කරතා මතු වී ඇත.

(ii) ආගමික උත්සව පැවැත්වීම

* පිරිත් දේශනා, ධර්ම දේශනා පැවැත්වීම
* පෙරහැර පැවැත්වීම, වන්දනා ගමන් යාම.
* චිත්‍ර මූර්ති, කැටයම්, නාට්‍ය වැනි කලා නිර්මාණ කිරීම.
* මාර්ග ඉදිකිරීම, පැල සිටුවීම, දුගී ජනයාට උදව් කිරීම. ආදී සුභ සාධන කටයුතුවල නියැලීම.
* විවේකී ව භාවනා කිරීම.
* ධර්මසාකච්ඡා පැවැත්වීම, දහම් පොත් රචනා කිරීම, ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යවල ගැළපෙන වැඩසටහන් නැරඹීම, ගිලානෝපස්ථානය ආදී කටයුතු විවේකය අර්ථවත් ව ගත කිරීම සඳහා යොදා ගත හැකි ය.

(ලකුණු 10 x 2 = 20)